තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## අයි.ජී.එල්. ජයවීර එ.දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 995/2019 (2019.06.03) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** - අයි.ජී.එල්. ජයවීර
**නොතිසි ලත් පාර්ශවය-** **ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය**

**පෙනීසිටීම**
අභියාචක - අයි.ජී.එල්. ජයවීර
පොදු අධිකාරිය - කිත්සිරි ලියනගමගේ- නියෝජ්‍ය ලේකම්
ඩබ්ලිව්.කේ.එන්. නදීෂ් - පී.එම්.ඒ.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.25 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.12.03 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.12.20 |

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:
අභියාචක විසින් 2018.10.25 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.
ලොග් පොතේ 2011.09.28 දින සිට 2011.11.25 දින දක්වා තබන ලද සියලු ලොග් සටහන්වල සහතික කළ පිටපත්
රාජකාරි අත්සන් පොතේ 2011.09.28 දින සිට 2011.11.25 දින දක්වා අත්සන් තබන ලද පිටුවල සහතික කළ පිටපත් සහ
නිවාඩු ලේඛනයේ 2011.09.28 දින සිට 2011.11.25 දින දක්වා ලබා ගත් නිවාඩු සටහන් කරන ලද පිටුවල සහතික පිටපත්

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.12.03 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයාද පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2018.12.20 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

ඉල්ලා ඇති තොරතුරු ආයතන කීපයකින් ලබා ගත යුතුව තිබුණු බැවින් තොරතුරු ප්‍රමාද වී ඇත. තාවකාලික ලොග් පොතේ සටහන් ඉල්ලා ඇත. ලොග් පොත් බාර ගත් නිලධාරී එවැනි අතිරේක ලේඛන බාර ගෙන නැති බව පවසයි. එම ලොග් පොත විනාශ කර ඇති බවද අභියාචක පවසයි.

**නියෝගය:**
අභියාචනය 2019.10.28 දිනට කල් තබන ලදී.
කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
*********************************

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 995/2019 (2019.10.28) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

.
**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ:ජනරාල්-** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**පෙනීසිටීම**

අභියාචක - අයි.ජී.එල්. ජයවීර

පොදු අධිකාරිය - කිත්සිරි ලියනගමගේ- නියෝජ්‍ය ලේකම්
ඩබ්ලිව්.කේ.එන්. නදීෂ් - පි.එම්.ඒ.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පාර්ශව දෙකම පැමිණ සිටිති. මූලික විමර්ශන වාර්තා නැති බව එනම් සන්තකයේ හෝ භාරයේ හෝ පාලනයේ නැති බව පොදු අධිකාරියේ පිළිගැනීමය. පනතේ 3 වගන්තිය ප්රකාරව එය නැත පොදු අධිකාරියේ තීරණය අනුමත කරනු ලැබේ. ගොනුවේ කටයුතු අවසන් වේ.

**නියෝගය:**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය නොපවතින හෙයින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.